WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'ශිවම්' යන වචනයේ අර්ථය කුමක් ද?

(ii) පැරණි ඉන්දියාවේ වෛද්‍ය කලාව හා සම්බන්ධ වේදය කුමක් ද?

(iii) "එඩුත්තවන් තරුක්කෙ ඉලිත්තවර් විරලාල්...." යන ගීතිකාවෙහි (පතිගම්) සඳහන් ශ්‍රී ලාංකේය රජතුමා කවරෙක් ද?

(iv) කුත්තු කලාවේ භාවිත වන සංගීත භාණ්ඩ **දෙකක්** සඳහන් කරන්න.

(v) ශ්‍රී ලංකාවේ ශෛව සමාජීය වර්ධනය ඉලක්ක කරගෙන ශෛව පරිපාලන සභාව මගින් ප්‍රකාශයට පත් කරන ලද ශෛව පුවත්පතෙහි නම සඳහන් කරන්න.

(vi) බ්‍රහ්මහත්ති දෝෂය තුරන් කර ගැනීම සඳහා ශ්‍රී රාම විසින් වන්දනා කරනු ලැබූ ශ්‍රී ලාංකේය ශිව දේවාල **දෙකක්** සඳහන් කරන්න.

(vii) මහනුවර දළදා මාළිගයට ආසන්නව ශිව දෙවියන් උදෙසා නිර්මාණය කරනු ලැබූ දේවාලය කුමක් ද?

(viii) ශෛව ආගමික ජීවිතයේ කොහොඹ ගසේ (වේප්පමරම්) ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

(ix) "ආංගෝර් ඒලෙක්කු එලුත්තරිවිත්තල්...." යනුවෙන් අධ්‍යාපනය ලබා දීමේ විශිෂ්ටතා සඳහන් කළේ කවරෙක් ද?

(x) උත්සව සමයේ දී අප නිරත විය යුතු ආගමික ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(ii) ඔබ විසින් ලියන ලද ගීතිකාවල තේරුම් ලියන්න.

(අ) "කුනිත්ත පුරුවමුං කොව්වෙච්..."

(ආ) "උණ්ණුන්ජ් සෝරු පරුගුනීර්..."

(ඉ) "ආත්තාලෙ එංගල් අභිරාම වල්ලියෙ..."

(ඊ) "අන්ද නාලනුන් අඩෙක්කලම් පුගුද..."

(උ) "විනායගනේ වෙව්විනෛයෙ වේරරුක්ක..."

**3.** "ඊංගිවෙතාම් ඕංගු පුගල්ත් තෙන්පුගලි වේන්දන් සෙයල්"

– තිරුක්කලිට්රුප්පඩියාර් –

(i) තිරුඥානසම්බන්තර්ගේ වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) තිරුඥානසම්බන්තර්ට, දෙවියන් රත්රන් තාලම්පට (පොට්ට්‍රාලම්) ලබා දුන් අවස්ථාව සඳහන් කරන්න.

(iii) තිරුඥානසම්බන්තර් කළ සමාජ සේවා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

[ගයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**4.** "අරන්දෙ තීර්ක්කුම් අඩියවර් මේනිමේල්
නිරන්ද නීට්ට්‍රෝලි යාල්නිරෙර තුයිමෙයාල්
පුරන්ද අංජේලුත් තෝසෙ පොලිදලාල්
පරන්ද ආයිරම් පාටිකඩල් පෝල්වදූ"

– පෙරියපුරාණම් –

(i) පෙරියපුරාණම් හි 'කාව්‍ය වීරයා' කවුද?

(ii) මෙම ගීතිකාවේ සඳහන් වී ඇති ශිව සංකේත (ශිවසින්නංගල්) මොනවා ද?

(iii) ඉහත (ii) හි ඔබ සඳහන් කරන ලද ශිව සංකේතවල සුවිශේෂී වූ වැදගත්කම කෙටියෙන් පහදන්න.

**5.** "තිරිමලත්තා රොන්ඩ්‍රදනිට් සෙන්ඩ්‍රාර්හල් අන්ඩ්‍රි
යොරුමලත්තා රායු මූලර්"

– තිරුවරුට්පයන් –

(i) තුන්වාර්ගික ආත්ම මොනවා ද?

(ii) තුන්වාර්ගික ආත්ම හා බැඳී තිබෙන මලම් කුමක් ද? ආත්ම නැවත නැවත ඉපදීමට හේතුව සඳහන් කරන්න.

(iii) ආත්ම විමුක්තිය ලබා ගැනීම සඳහා වන මාර්ග **හතර** පිළිබඳව කෙටියෙන් පහදන්න.

**6.** "කෝයිල් ඉල්ලා ඌරිල් කුඩියිරුක්ක වේන්ඩාම්" (දේවාල නොමැති ගමේ ජීවත් නොවන්න.)

– ඖවෙයාර් –

(i) තිරුක්කේදීශ්වරම් දේවස්ථානයේ තීර්තම් හි නම කුමක් ද?

(ii) පොන්නාලෙ වරදරාජ පෙරුමාල් දේවාලයේ පැවැත්වෙන උත්සව **තුනක්** සඳහන් කරන්න.

(iii) මන්ඩූර් මුරුගන් දේවාලය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) මාර්ගලි තිරුවාදිරෛ

(ii) කුමරගුරුබරර්

(iii) පාසලේ ශෛවම්

(iv) ආගමංගල්

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....